## පළමුවන කියැවීම

ජෝෂුවා 24:1-2,15-18

ජෝෂුවාගේ පොතෙන් ගත් පාඨයෙකි.

**අපගේ දෙවියන් වන සමිඳාණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නෙමු.**

ඉන්පසු ජෝෂුවා සියලු ඉශ්රායෙල් ගෝත්‍රයන් ෂෙකෙම්ට රැස් කරවා, ඉශ්රායෙල්වරුන්ගේ ප්‍රජා මූලිකයන් ද ප්‍රධානීන් ද විනිශ්චයකාරයන් ද නිලධාරීන් කැඳවීය. ඔව්හු දෙවියන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියෝ ය. ජෝෂුවා මුළු සෙනගට මෙසේ කීවේ ය. "ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. යටගිය දවස ආබ්‍රහම්ගේ ද, නාහෝර්ගේ ද පිය වූ තෝරා වැනි, නුඹලාගේ පියවරු යුප්‍රටීස් ගඟෙන් එතෙර වාසය කරමින් අන් දෙවිවරුන්ට වැඳුම් පිදුම් කළෝ ය. සමිඳාණන් වහන්සේට වැඳුම් පිදුම් කිරීමට ඔබ සතුටු නැත්නම් ඔබ වැඳුම් පිදුම් කරන්නට කැමති කවරෙකුට ද කියා අදම තීරණය කර ගන්න. ගඟින් එතෙර සිටි ඔබේ පියවරුන් වැඳුම් පිදුම් කළ දෙවිවරුන්ට හෝ ඔබ වාසය කරන දේශයේ සිටින අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට හෝ වැඳුම් පිදුම් කරන්නට තීරණය කර ගන්න. එහෙත් අපි එනම් මාගේ පවුල ද, මම ද සමිඳාණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නෙමු. සෙනග පිළිතුරු දෙමින් "අන් දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන පිණිස කවරදාවත් අපි සමිඳාණන් වහන්සේ අත් නොහරින්නමු. අප සහ අපේ පියවරුන් මිසර දේශය නැමති වහල්කමේ නිවාසයෙන් පිටතට ගෙනාවේත්, අපේ ඇස් ඉදිරියේ මහත් හාස්කම් කළේත්, අපේ මුළු මාර්ගයේ දී ද අප පසුකර ආ මුළු සෙනග අතරේ දී ද අප ආරක්ෂා කළේත් අපේ දෙවි සමිඳාණන් වහන්සේ ම ය. සමිඳාණන් වහන්සේ සියලු මනුෂ්‍ය වර්ගයන් ද දේශයේ සිටි අමෝරිවරුන් ද අප ඉදිරියෙන් එළවා දැමූ සේක. එබැවින් අපිත් සමිඳාණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නෙමු. මන්ද, උන් වහන්සේ අපේ දෙවියන් වහන්සේ යැ"යි කීවෝය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 34:1-2,15-22

පිළිතුර: සමිඳාණන් ගුණවත් බව අත්දැකීමෙන් දැනගන්න.

ගීය: හැම වේලේ ම හිමි තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැනුම් මා මුවින් තොර නොවෙයි. මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානි අය ඒ අසා සතුටු වෙත්වා.

හිමි තුමන්ගේ දෙනෙත දැමිටුන් දෙසට ද එතුමන්ගේ දෙසවන ඔවුන්ගේ කන්නලව්වට ද යොමුව ඇත. පව්කම් කරන අය පොළොවෙන් අමතක වී යන ලෙස හිමි තුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක. දැහැමි අය අයැදුම් කළහ. හිමි තුමාණෝ සවන් දී සියලු දුක් වේදනාවෙන් ඔවුන් මිදූ සේක.

හිමි තුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළංව සිටින සේක. තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක. දැමිටුන්ට බොහෝ ආපදා ඇතත්, හිමි තුමාණෝ ඒ සියල්ලෙන් ඔවුන් මුදා හරින සේක. එතුමාණෝ ඔවුන්ගේ ඇඟේ එක ඇටය තුදු නැර ඔවුන් රක්නා සේක. ඉන් එකක් වත් බිඳෙන්නට නොහරින සේක.

දුෂ්ටයා නපුරෙන් වැනසෙයි. දැහැමි අයට දෙස් තබන්නෝ දඬුවම් ලබන්නෝ ය. හිමි තුමාණෝ සිය මෙහෙකරුවන් මුදන සේන. එතුමන් කෙරේ විශ්වාසය තබන කිසිවෙක් දඬුවම් නොලබන්නෝ ය.

## <u>දෙවන කියැවීම</u>

එපේසි 5:21-32

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**මෙය මහා අභිරහසකි. එය අදාළ වන්නේ ක්‍රිස්තුස් වහන්සේට සහ සභාවට ය.**

ක්‍රිස්තුස් වහන්සේට ඇති ගෞරවය නිසා එකිනෙකාට යටත් වන්න. භාර්යාවෙනි, ඔබ සමිඳුණන් වහන්සේට මෙන් තම ස්වාමි පුරුෂයන්ට යටත් ව සිටින්න. මන්ද, ක්‍රිස්තුස් වහන්සේ සභාවේ හිස වන්නාක් මෙන් පුරුෂයා භාර්යාවගේ හිස ය. එබැවින් සභාව ක්‍රිස්තුස් වහන්සේට යටත් වන්නාක් මෙන්, භාර්යාවන් ද සියලු දේවල දී පුරුෂයන්ට යටත් විය යුතුය. පුරුෂයෙනි, ක්‍රිස්තුස් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් සිය දිවි පුද කළාක් මෙන්, ඔබත් ඔබගේ භාර්යාවන්ට ප්‍රේම කරන්න. උන් වහන්සේ එසේ කළේ, වතුරෙන් ද වචනයෙන් ද සභාව සෝදා පිරිසිදු කර, කැප කර, එය තේජාන්විත සභාවක් වශයෙන් කැළලක් වත්, රැල්ලක් වත්, එබඳු කිසිවක් වත් නැතිව විශුද්ධ ව, නිකෙලෙස් ව, තමන්ට ම ප්‍රදානය කර ගැනීමට ය. එසේම පුරුෂයන් විසින් ද තම භාර්යාවන්ට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතුය. සිය භාර්යාවට ප්‍රේම කරන තැනැත්තා තමාට ම ප්‍රේම කරගන්නේ ය. කවරෙකුවත් කිසිම කලෙක තමාගේ ශරීරයට ද්වේශ කර ගෙන නැත. එසේ නොව, ඔහු එය පෝෂණය කර ගෙන ආරක්ෂා කරයි. ක්‍රිස්තුස් වහන්සේ සභාව ගැන සළකන්නේත් එසේ ම ය. මන්ද, අපි ඒ ශරීරයේ අවයවයෝ වෙමු. මේ නිසා මිනිසෙක් තමාගේ මව ද පියා ද අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙනා එක් කෙනෙක් වන්නෝ ය. මෙය මහා අභිරහසකි. මට හැඟෙන පරිදි එය අදාළ වන්නේ ක්‍රිස්තුස් වහන්සේට සහ සභාවට ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## <u>සාධුකාරය</u>

ජුවාම් 6:63,68

ආලේලූයා! ආලේලූයා! "මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි."
සදතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය. ආලේලූයා!

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

ජුවාම් 6:60-69

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ස්වාමිනි, අප කවරෙකු වෙතට යන්නද? සදතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය."**

ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ශරීරය අනුභවය සඳහා දෙන බව ඇසූ විට, උන්වහන්සේගේ ගෝලයෝ බොහෝ දෙනෙක් "මෙය දරා ගන්නට බැරි කීමකි, එතුමාණන් හට සවන් දී සිටිය හැක්කේ කාටද" යි තමන් අතරේ කතා කර ගත්හ. ගෝලයන් මෙසේ මැසිවිලි කියන බව ජේසුස් වහන්සේ දිවැසින් දැන, ඔවුන් අමතා, "මෙය ඔබට අධෛර්යයට පත් වීමට හේතුවක්ද? එසේ නම්, මනුෂ්‍ය - පුත්‍රයාණන් පෙර සිටි තැනට නඟිනු බව ඔබ දුටුවොත් කෙසේද? ජීවනය දෙන්නේ ආත්මය වේ. මාංසයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි. එහෙත් නොඅදහන සමහරෙක් ඔබ අතරෙහි සිටිති" යි වදාළ සේක. එසේ වදාළේ, නොඅදහන්නෝ කවුරු ද කියාත්, තමන් වහන්සේ පාවා දෙන්නට යන්නේ කවරෙක්ද කියාත්, ජේසුස් වහන්සේ මුල සිටම දැන සිටි බැවිනි. එහෙයින් උන්වහන්සේ ඔවුන් අමතා, "මාගේ පියාණන් වහන්සේගෙන් වරය ලැබූ කෙනෙකුට මිස, අන් කිසිවෙකුට මා වෙතට පැමිණිය නොහැකි බව මා කීවේ ඒ නිසාය" යි වදාළ සේක. මේ නිසා එවක් පටන් උන්වහන්සේගේ ගෝලයන්ගෙන් බොහෝ දෙනෙක් පසුබට වී, තවත් උන්වහන්සේ අනුව නොගියහ. ජේසුස් වහන්සේ දොළොස් දෙනා අමතා, "ඔබත් ඉවත්ව යන්නට සිතන්නහුද" යි ඇසූ සේක. සීමොන් පේදුරු පිළිතුරු දෙමින්, "ස්වාමිනි, අප කවරෙකු වෙතට යන්නද? සදතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය. ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධවරයාණන් බව අපි අදහමු. එසේම ඒ බව දනිමු" යි කීය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.